Article 13 (2)
Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019 - 10 - 30

පැමිණිලිකාරිය : එස්.එච්. ශරීනා මිය,
330 ඒ, මඩිගේ මිදියාල,
බණ්ඩාර, කොස්වත්ත.

අගතියට පත් පාර්ශවය : 01. සාදිකින් මොහොමඩ් සියාම් මයා,
02. කමුර්දින්ගේ සාදිකින් මයා,

වගඋත්තරකරුවන් : 01. සහකාර පොලිස් අධිකාරි ප්‍රනාන්දු මහතා,
සහකාර පොලිස් අධිකාරි කාර්යාලය,
කුලියාපිටිය.

02. උ.පො.ප.පාලිත හේරත් මහතා,
ස්ථානාධිපති - අපරාධ අංශය,
පොලිස් ස්ථානය, බිංගිරිය.

03. පො.සැ.31749 ගුණවර්ධන මයා,
පොලිස් ස්ථානය, බිංගිරිය.

04. පො.සැ.25245 ධර්මපාල මහතා,
පොලිස් ස්ථානය, බිංගිරිය.

05. පො.සැ.54510 ගුණවර්ධන මහතා,
පොලිස් ස්ථානය, බිංගිරිය.

06. පො.කො.10164 සිල්වා මහතා,
පොලිස් ස්ථානය, බිංගිරිය.

07. පො.කො.34042 බි.එම්.නිහාල් රත්නසූරිය මයා,
පොලිස් ස්ථානය, බිංගිරිය.

පැමිණිලි අංකය : HRC/4715/13

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, තම පුතා වන එස්.එම්. සියාම් සහ ස්වාමි පුරුෂයා වන එම්.කේ. සාදිකින් යන අයව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පුද්ගලයකුගේ මරණයක් සම්බන්ධයෙන් සැකපිට 2013-11-29 වන දින පස්වරු 4.00ට පමණ වගඋත්තරකරුවන් විසින් අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී අමානුෂික අන්දමින් පහරදුන් බවත්ය. පසුව 2013-12-02 වන දින අධිකරණයට ඉදිරිපත් කළ බවට දන්වා සිටින ලද අතර, පැමිණිලිකාරිය ඒ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් මගින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ අනුව අගතියට පත් පාර්ශවයට වධහිංසා පැමිණවීම හා නීති විරෝධීව රඳවාතබා ගත් බවට පැමිණිල්ලෙන් කරුණු දක්වයි.

අත්අඩංගුවට ගැනීම සනාථ කිරීම සඳහා පැමිණිලිකාරිය විසින් ඇසින් දුටු සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශ මගින් 2013-11-29 වන දින අගතියට පත් අයව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පහරදෙනු දුටු බවට සඳහන් කර ඇත.

**අගතියට පත් අයගේ කරුණු දැක්වීම :-**

<u>මොහොමඩ් නිසාම් යන අයගේ කරුණු දැක්වීම</u>

අගතියට පත් මොහොමඩ් නිසාම් යන අය දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් කියා සිටිනුයේ 2013-11-29 වන දින තමා මවගේ නිවස අසල සෙල්ලම් කරමින් සිටියදී ඔවුන්ගේ පියාව අල්ලා ගෙන පැමිණි පුද්ගලයන් 04 දෙනෙකු තමාවද අල්ලාගෙන මාංචු දමා ඩබල් කැබ් රථයකට නංවාගත් බවත්, එම නිලධාරින් බිංගිරිය පොලිස් ස්ථානයේ සේවය කරන අය බව තමාට දැන ගැනිමට ලැබු බවත්, එසේ ඔවුන් තමාව රැගෙන ගියේ බිංගිරිය පොලිස් ස්ථානයට බවත්, තමාගේ ඇස් දෙකම බැඳ තිබු බවත්, ඇස් ලිහා දමන විට පියා එම ස්ථානයේ නොසිටි බවත්, පසුව තමාව කාමරයක දමා දොර වැසු බවත් සඳහන් කර ඇත.

එදින සවස 5.30ට පමණ එකි පොලිස් නිලධාරින් 04 දෙනා තමා සිටි කාමරයට පැමිණ එක් අයෙකු තමාව කාමරයේ මුල්ලකට කොට තමාගේ ටීෂර්ට් එක සහ ඇඳ සිටි කොට කලිසමද ගැලවීමෙන් පසු තම ගමේ තරුණයකු එල්ලී මිය යෑම සම්බන්ධයෙන් ඇත්ත කියන ලෙස ප්‍රශ්න කරමින් පහරදුන් බවත්, පසුව ඒ බව තමා කිසිවක් නොදන්නා බව ප්‍රකාශ කළ බවත්, තමාගේ අත්දෙක බැඳ කකුල් දෙක වලලුකර මතින් බැඳ දමා අත්දෙක අතරින් දණිස්දෙක ළගින් තමා කකුල් දෙක අතරින් පොල්ලක් යවා එම පොල්ල මැද ලණුවක් දමා වහලේ බාල්කේ එල්ලා පරුෂ වචනයෙන් බැණ වදිමින් ඉතා අමානුෂික ලෙස බොහෝ වේලාවක් පොල්ලකින් තම පාදයේ යටිපතුල්වලට එම පොල්ල කැඩෙනතුරුම පහරදුන් බවත් ප්‍රකාශ කර ඇත.

පසුව තමාව බිමට බස්සවා පොලිස් නිලධාරියකු සපත්තු දමා ගෙන තමාගේ කකුල් දෙක උඩට නැග්ග බවත්, පසුව තමාගේ යට ඇඳුම ගැලවීමට දන්වා යට ඇඳුම ගැලවු පසුව තමාගේ පුරුෂ ලිංගය ප්‍රදේශයට වැරෙන් පයින් පහරක් ගැසු බවටද එම පහර තමාට දරා ගැනිමට නොහැකි වු බවත්, පසුව තමා තමාගේ පුරුෂ ලිංගය අල්ලාගෙන කෑගසමින් බිම දිගා වු බවත්, ඒ අවස්ථාවේදී තමාට සිහිය නැති වු බවත් තමාට

සිහිය එන විට යකඩ ඇඳකට මාංචු දමා තිබූ බවත්, පසුව පොලිස් නිලධාරීන් 04 දෙනෙකු පැමිණ තමාගේ මාංචු ගලවා නැවත වතාවක් නිර්වස්ත්‍රව කාමරයේ බාල්කයේ එල්ලූ බවත් එසේ එල්ලා කකුල් දෙකේ යටිපතුල් වලට අමානුෂික අන්දමින් පහරදුන් බවත්, තමා වතුර ටිකක් ඉල්ලූ විට තමාට වතුර බීමට ඉඩ නොදුන් බවත් ප්‍රකාශ කර ඇත.

දින දෙකකට පසුව තමාව අධිකරණයට රැගෙන ගිය බවත්, අධිකරණයේ නියමය පරිදි පේරාදෙණිය ශික්ෂණ රෝහලට යවා ප්‍රතිකාර ලබා ගත් බවත් ප්‍රකාශ කර ඇත. මෙම පහරදීම නිසා තමාගේ පුරුෂ ලිංගය අප්‍රාණික වී හිරිවැටෙන බවත්, ඒ සඳහා තමා තවදුරටත් ප්‍රතිකාර ලබා ගන්නා බවත් මෙම පහරදීම නිසා තමා කායික හා මානසික රෝගියකු බවට පත් වූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>කමුර්දීන්ගේ සාදිකින් යන අයගේ කරුණු දැක්වීම</u>

තමා 2013-11-29 වන දින නිවසේ සිටියදී බිංගිරිය පොලිස් ස්ථානයේ සේවය කරන නිලධාරීන් විසින් තමාව අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවට ගෙන මාංචු දමා කැබ් රථයක නංවා ගත් බවත්, ඉන්පසුව තම පුතා වන සාදිකින් මොහොමඩ් සියාම් යන අයවද අත්අඩංගුවට ගෙන බිංගිරිය පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්, තමා කාමරයක් වැනි තැනකට රැගෙන ගොස් යකඩ ඇඳක වාඩි කරවා අත්දෙකට මාංචු දමා එල්ලී මිය ගිය අය සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් තමාට පහරදුන් බවත් තමා එසේ කාමරයේ සිටින විට පුතාට අමානුෂික අන්දමින් පහරදුන් බවත්, පුතා හයියෙන් කෑ ගැසූ බවත්, තමාට ඒ ශබ්දය ඇසුණු බවත් සඳහන් කර ඇත. පසු දින පොලිස් නිලධාරීන් 04 දෙනෙකු තමා සිටි කාමරයට පැමිණ අත්කකුල් බැඳ කකුල් දෙකයි අත්දෙකයි අතරින් පොල්ලක් යවා එම පොල්ලේ මැදට ලණුවක් දමා වහලේ බාල්කයේ එල්ලූ බවත්, එසේ එල්ලා අමානුෂික අන්දමින් සැහෙන වේලාවක් පොලු වලින් යටිපතුල් වලට පහරදුන් බවත් එම පහරදීම නිසා තමා සිහිසුන් වූ බවත් සඳහන් කර ඇත. තමාට සිහිය එනවිට තමාව බිමට බස්සා තිබූ බවත්, තමාගේ කකුල් දෙක සහ අත්දෙක බැඳ තබා කකුල් දෙක සහ අත්දෙක අතරින් ඇතුල් කළ පොල්ලද එලෙස තිබූ බවත්, තමා වතුර ඉල්ලූ විට එක් නිලධාරියකු වතුර සුළු ප්‍රමාණයක් තමාගේ කටට දැමූ බවත් ප්‍රකාශ කර ඇත.

පසුව තමා ඇඳ සිටි සරම ගලවා තමාව නිර්වස්ත්‍ර කොට තමාගේ පුරුෂ ලිංගයට මිරිස් කුඩු දැමූ බවත්, ඉවසා ගැනීමට නොහැකි තරම් දැවිල්ලක් ඇති වූ බවත්, නැවත වතාවක් බාල්කයේ එල්ලා යටිපතුල්වලට පහරදුන් බවත් පසුව බිමට බස්සවා සපත්තු දැමූ කකුල් වලින් තමාගේ ශරීරය පෑගූ බවත් සඳහන් කර ඇත. අනතුරුව අධිකරණයට ඉදිරිපත් කර අධිකරණ නියෝග මත පේරාදෙණිය ශික්ෂණ රෝහලට යවා ප්‍රතිකාර ලබා ගත් බවත් සඳහන් කර ඇත. තමාට මෙසේ පහර දුන් නිසා තමා ආබාධියකු බවට පත් වූ බවත්, රැකියාව කරගෙන යාමට නොහැකි තත්ත්වයකට පත්වූ බවත් සඳහන් කර ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තා :-

1. <u>මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම්</u> යන අයට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව 2014-01-17 වන දින අධිකරණ වෛද්‍ය පරීක්ෂණයට යොමු කර ඇති අතර. එය අදාළ සිදු වීම සිදු වී මාස 1 1/2කට පසු අධිකරණ වෛද්‍ය පරීක්ෂණය වෙත යොමු කර ඇත්තේ වාරියපොල මහේස්ත්‍රාත් අධිකරණය මගින් ලබා දී ඇති නියෝගයකට අනුව වේ. අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියාගේ කෙටි ඉතිහාසය යටතේ " 2013-11-27 වන දින තමාව සහ තම පියාව අත්අඩංගුවට ගත් බව හා තමාගේ ඇඳුම් ගලවා ලණුවකින් අත්දෙක බැඳ කකුල් දෙකද බැඳ පොල්ලක් දණිස්ස සහ අත්දෙක අතරින් දමා බාල්කයේ දමා අමානුෂික අන්දමින් පොලු වලින් පහරදුන් බවට" සඳහන් වී ඇත. එම අධිකරණ වාර්තාවට අනුව සැකකරුගේ තුවාල 06ක් ඇති බවට සඳහන් වේ.

එම තුවාල 01 සිට 02 දක්වා සිරීම් තුවාල බවත්, බරපතල නොවන බවත්, එම තුවාල සිදු වී ඇත්තේ මොට ආයුධ වලින් බවට වෛද්‍යවරයාගේ මතය ප්‍රකාශ කර ඇති අතර, 01 සහ 02 යන තුවාල රෝගියාගේ කෙටි ඉතිහාසය හා සැසෙඳෙන බවත්, 03 සිට 06 දක්වා ඇති තුවාල රෝගියාගේ රෝග ඉතිහාසය හා නොසැසඳෙන බවත් සඳහන් කර ඇත.

2. <u>කාමුර්දීන් සාදිකින්</u> යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව වෛද්‍ය පරීක්ෂණය සිදු කර ඇත්තේ 2014-01-17 වන දින වන අතර එයද එය සිද්ධිය වී මාස 1 1/2කට පසුව වාරියාපොල මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයකට අනුව යොමු කර ඇත. රෝගියා විසින් දෙන ලද කෙටි ඉතිහාසයේ ඔහුට පහරදීම සම්බන්ධයෙන් විස්තර සඳහන් කර ඇත. වෛද්‍ය වාර්තාවට අනුව තුවාල කැළැල් 17ක් ඇති බවට සඳහන් වී ඇති අතර එම තුවාල රෝගියාගේ කෙටි ඉතිහාසය හා සැසඳෙන බවට වෛද්‍යවරයා සඳහන් කර ඇත.

වාරියපොල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 420/2013 දරණ නඩුවේ නඩු වාර්තාවට අනුව 2014-01-08 වන දින සැකකරුවන්ව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විශේෂඥ වෛද්‍ය නිලධාරියකු වෙත ඉදිරිපත් කර වාර්තාව කැඳවන ලෙස මහේස්ත්‍රාත් නියෝග කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු ඉදිරිපත් කිරීම :-

<u>01 වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි පියසිරි ප්‍රනාන්දු</u> යන අය විසින් වාර්තාවක් සපයා ඇති අතර එම වාර්තාවේ සඳහන් වන්නේ 2013-08-24 වන දින වාරියපොල පොලිස් ස්ථානයට වාර්තා වී ඇති සූර්තාන් පත්තුව, බණ්ඩාරකොස්වත්ත ලිපිනයෙහි පදිංචිව සිටි එම්.වයි.එම්. රිෆාද් යන අයගේ අභිරහස් මරණය සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිවරයා වෙත යොමු කර ඇති පෙත්සමට අනුව වයඹ නියෝජ්‍ය පොලිස්පති මගින් තමා වෙත සිද්ධියට අදාළ විමර්ශනයක් කිරීමට නියෝග කර ඇති බවයි. එම විමර්ශනයේදී අනාවරණය වූ කරුණු අනුව 2013-10-31 වන දින වැඩිදුර වාර්තාවක් වාරියපොල මහේස්ත්‍රාත්වරයා වෙත යොමු කළ බවද සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණය සඳහා 2015.06.25 වන දින පාර්ශවයන් කැඳවා විමර්ශනයක් කර ඇති අතර එහිදී වගඋත්තරකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. එම පරීක්ෂණය සඳහා 01 වගඋත්තරකරු සිට 07 වගඋත්තරකරු දක්වා සිතාසි යොමු කර ඇති නමුත් 01 වන වගඋත්තරකරු කොමිෂන් සභාවට ඉදිරිපත් වී නොමැති අතර, සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

02 වගඋත්තරකාර පොලිස් පරීක්ෂක හේරත්මුදියන්සේලාගේ පාලිත හේරත් යන අය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - වයඹ පළාත විසින් සහකාර පොලිස් අධිකාරිව සිටි පියසිරි ප්‍රනාන්දු මහතා වෙත කරන ලද නියෝගයකට අනුව ඔහු විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන ලෙසට තමා වෙතට දැන්වූ බවත්, ඒ අනුව කරන ලද පරීක්ෂණය මත 2013-12-01 වන දින මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම් සහ කාමුර්දීන් සාදිකින් යන අය අත්අඩංගුවට ගෙන බිංගිරිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමෙන් පසු 2013-12-02 වන දින සැකකරුවන් කුලියාපිටිය අධිකරණය වෙත ඉදිරිපත් කර අනතුරුව සැකකරුවන්ව නඩු අංක බී 420/13 යටතේ වාරියපොල මහේසත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2013-12-11 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත්ය. මෙම අත්අඩංගුවට ගැනීම සඳහා පො.සැ.31749 ගුණවර්ධන, පො.සැ.25149 ධර්මපාල, පො.සැ.54510 ගුණවර්ධන සහ පො.කො.10164 සිල්වා යන අය සහභාගි වූ බවද සඳහන් කර ඇත. එසේම අත්අඩංගුවට ගැනීමෙන් පසු කිසිදු පහරදීමක් සිදු නොකළ බවත්, පහරදීමක් සිදු කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය නිලධාරියාට හෝ වාරියපොල මහේස්ත්‍රාත්වරයා වෙත ප්‍රකාශ කිරීමට අවස්ථාව තිබූ නමුත් එසේ සිදු කර නොමැති බවත් ප්‍රකාශ කර ඇත. එම නිසා අමානුෂික අන්දමින් පහරදුන් බවට කරන ලද ප්‍රකාශය තමා ප්‍රතික්ෂේප කරන බවද ප්‍රකාශ කර ඇත. මෙම සැකකරුවන්ට අමතරව මෙම සිද්ධිය සම්බන්ධයෙන් තවත් සැකකරුවකු වන ඊබ්‍රුහන් හංසාල් යන අයද අත්අඩංගුවට ගත් බවද සඳහන් කර ඇත. ඔහුගෙන් ප්‍රකාශය සටහන් කරන අවස්ථාවේදී සැකකරුවන් රාජකාරියට බාධාවන අයුරින් කටයුතු කළේ ද යන ප්‍රශ්නයට පිළිතුරු ලබා දී ඇත්තේ සිය රාජකාරිය බාධා වන අයුරින් කටයුතු නොකළ බවත්, අත්අඩංගුවට ගැනීමේදී සැකකරුවන් මෙල්ල කිරීම සඳහා හෝ අවනත කිරීම සඳහා අවම බලයක් පාවිච්චි කිරීමට සිදු වූ බවත්, ප්‍රථමයෙන් අත්අඩංගුවට ගත් මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම් යන අය පැන යාමෙන් අනතුරුව හඹා ගොස් ඔහු අත්අඩංගුවට ගැනීමට සිදු වූ බවත්ය. සැකකරුව අත්අඩංගුවට ගැනීමෙන් පසුව ශරීරය පරීක්ෂා කිරීමේදී සීරීම් තුවාල නිරීක්ෂණය වූ බවද සඳහන් කර ඇත.

03 වන වගඋත්තරකරු වන පො.සැ.31749 ගුණවර්ධන යන අය කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ සැකකරු අත්අඩංගුවට ගැනීමට සහ පරීක්ෂණය සඳහා තමා සහභාගි වූ බවට පිළිගන්නා බවයි. නමුත් පහරදීම් සම්බන්ධයෙන් චෝදනා ප්‍රතික්ෂේප කරන බවද සඳහන් කර ඇත.

04 වන වගඋත්තරකරු වන පො.සැ.25245 ධර්මපාල යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ අදාළ විමර්ශනය සඳහා තමා සහභාගි වූ බවත්, පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද චෝදනා (පහරදීම් සම්බන්ධයෙන්) ප්‍රතික්ෂේප කරන බවත්ය.

05 වන වගඋත්තරකරු වන පො.සැ.54510 ගුණවර්ධන යන අය ප්‍රකාශයක් ලබා දෙමින් දන්වා ඇත්තේ සැකකරු අත්අඩංගුවට ගැනීම සහ අදාළ විමර්ශන කටයුතු සඳහා තමන් සහභාගී වූ බවයි. එසේම පැමිණිලිකරු විසින් කරන ලද චෝදනා ප්‍රතික්ෂේප කරන බවද සඳහන් කර සිටියි.

06 වන වගඋත්තරකරු වන පො.කො.10164 සිල්වා යන අය කොමිෂන් සභාව වෙත ප්‍රකාශයක් ලබා දෙමින් සඳහන් කර ඇත්තේ, සැකකරු අත්අඩංගුවට ගැනීම සහ අදාළ විමර්ශන කටයුතු සඳහා තමන් සහභාගී වූ බවත් එසේම පැමිණිලිකරු විසින් කරන ලද චෝදනා ප්‍රතික්ෂේප කරන බවත්ය.

07 වන වගඋත්තරකරු වන පො.කො.34042 බී.එම්. නිහාල් රත්නසූරිය යන අය ප්‍රකාශ කර සිටින්නේ අත්අඩංගුවට ගැනීමට හෝ විමර්ශනය සඳහා තමා සහභාගී නොවූ බවයි. එසේම පහරදීම් කරන ලද චෝදනා ප්‍රතික්ෂේප කරන බවද සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගෙන ඇත්තේ 2013-11-29 වන දින වන අතර ඒ බව පැමිණිල්ල තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති එම්.එස්.එම්. කලාම් සහ එස්.එච්. රිස්මි යන අයගේ දිවුරුම් ප්‍රකාශ මගින් තහවුරු වේ.

පැමිණිල්ල විසින් අගතියට පත් අයට පහරදුන් බවට වාරියපොල මහේස්ත්‍රාත්වරයා වෙත 2013-12-11 වන දින ප්‍රකාශ කර ඇති බවට වාරියපොල මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී 420/13 දරණ නඩු වාර්තාවට අනුව තහවුරු වේ. එසේම 2014-01-08 වන දින සැකකරුවන් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබා දෙන ලෙසට ගරු අධිකරණය විසින් බන්ධනාගාර අධිකාරිය වෙත නියෝග කර ඇති අතර එය නඩු වාර්තාවට අනුව තහවුරු වේ.

මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව මෙම අගතියට පත් අය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කර ඇත්තේ මාස 1 1/2කට පසු බවට වෛද්‍යවරයා විසින් සඳහන් කර ඇත.

ඒ අනුව රෝගී ඉතිහාසයේ පොලිස් අත්අඩංගුවේ සිටි අවස්ථාවේදී පහරදුන් බවට අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ප්‍රකාශ කර ඇති බවද සඳහන් කර ඇත.

මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම් යන අයගේ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව අධිකරණ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ තුවාල 06ක් ඇති බවත්, 01 සහ 02 යන තුවාල රෝගියාගේ ඉතිහාසය සමග සැසඳෙන බවත්, 03 සිට 06 දක්වා තුවාල රෝගියා ඉදිරිපත් කර ඇති කෙටි ඉතිහාසය සහ නොසැසඳෙන බවත්ය.

මෙහිදී වෛද්‍යවරයාගේ මතය පෙත්සම්කරුගේ කතාවට සහයෝගය දක්වන්නේද යන කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී සරත් කුමාර එරෙහිව කල්දේරා SCFR 124/95, SCM 30.11.96 නඩුවේ කරුණු එය වඩාත් තහවුරු කර ඇත. එම නඩු තීන්දුව කෙරෙහි අවධානය යොමු කිරීමේදී වෛද්‍ය වාර්තාවන් පෙත්සම්කරුගේ පැමිණිල්ල සමග සර්ව සම්පූර්ණයෙන්ම නොසැසඳෙන අවස්ථාවන්හිදී සලකා බැලිය යුතු කරුණ වනුයේ එම වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි සියල්ල එකට ගත්කල පෙත්සම්කරුගේ කතාවට සහයෝගය දක්වන්නේද යන වග වන බවට දක්වා ඇත. මන්ද යත් වෛද්‍ය විද්‍යාත්මක සාක්ෂි වින්දිත විසින් පවසන ලද තොරතුරු වන තීරණාත්මක ස්වභාවය විය යුතු නොවන නිසා බවද දක්වා ඇත.

කමුර්දීන් සාදිකින් යන අය සම්බන්ධයෙන් වන අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව රෝගියාගේ තුවාල 17ක් තිබී ඇති බවට සඳහන් වන අතර වෛද්‍යවරයාගේ මතය අනුව 01 සිට 11 දක්වා ඇති තුවාල තැලීම් සහ සිරීම් වලින් සිදු වූ ඒවා බවත්, එසේම ඒවා මොට ආයුධ වලින් සිදු වූ තුවාල බවත්, ඒවා බරපතල නොවන තුවාල බවත් සඳහන් කර ඇත. 01 සිට 17 දක්වා ඇති තුවාල කැලැල් රෝගියාගේ කෙටි ඉතිහාසය සමග සැසඳෙන බවටද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුවන් දක්වන කරුණු වෛද්‍යවරයාගේ මතය හා එකග වන බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ 2013-12-01 වන දින අත්අඩංගුවට ගත් බවට වන අතර, සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ 2013-12-02 වන දිනය. අගතියට පත් පාර්ශවය අත්අඩංගුවට ගත් බවට පැමිණිල්ලේ සඳහන් දිනය වන්නේ 2013-11-29 දින වන අතර ඒ බව පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ අනුවද තහවුරු වී ඇත.

ඒ අනුව වගඋත්තරකරුවන් විසින් සැකකරුවන්ව 2013-11-29 වන දින සිට 2013-12-02 දින දක්වා රඳවා තබා ගෙන ඇති බවට තහවුරු වේ.

07 වන වගඋත්තරකරුවකු ලෙස නම් කර සිතාසි යොමු කර තිබුණද පැමිණිලිකරු කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කරනුයේ මෙම නිලධාරියා අත්අඩංගුවට ගැනීමට හෝ පහරදීමට සම්බන්ධ නොවූ බවයි. එම නිසා 07 වන වගඋත්තරකාර පො.කො 34042 බී.එම් නිහාල් රත්නසූරිය යන අය වගඋත්තරකාර වගකීමෙන් මෙම නිලධාරියාව නිදහස් කරනු ලැබේ.

**නිගමනය :-**

විමර්ශනයේදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව අගතියට පත් අය වන **මොහොමඩ් සාදිකින් මොහොමඩ් සියාම් සහ කාමුර්දීන් සාදිකින්** යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ 2013-11-29 වන දින බවත්, අධිකරණයට ඉදිරිපත් කර ඇත්තේ 2013-12-02 වන දින බවත්, අනාවරණය වන අතර ඒ අනුව දින 03ක් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් රඳවා තබා ගැනීම තුළින් අගතියට පත් පාර්ශවයට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවයව විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම වෛද්‍ය වාර්තා වලට අනුව සහ ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශ වලින් අගතියට පත් පාර්ශවයට අමානුෂික අන්දමින් සැලකීම සහ පහරදීම් සිදු කර ඇති බවට තහවුරු වන අතර, එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කොට දී ඇති අගතියට පත් පාර්ශවයේ මූලික අයිතිවාසිකම් වගඋත්තකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවටද නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. 1-6 දක්වා වූ එක් එක් වගඋත්තරකරුවන් විසින් එක් අගතියට පත් පාර්ශවයක් වෙත රු. 5000/- බැගින් අගතියට පත් පාර්ශවය වෙත රු. 10,000/- ක මුදලක් ගෙවිය යුතුය.

   (උදා -: 1 වන වගඋත්තරකරු විසින් අගතියට පත් මොහොමඩ් සියාම් යන අයට රු. 5000/- ක්ද, කාමුර්දීන් සාදිකීන් යන අයට රු. 5000/- ක්ද වශයෙන් රුපියල් 10,000/- ක මුදලක් ගෙවිය යුතුය. අනෙකුත් වගඋත්තරකරුවන්ද වෙන් වෙන්ව ඉහත පරිදි අදාළ ගෙවීම් කටයුතු කළ යුතුය)

2. මෙම වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, නීතිපති සහ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරනු ලැබේ.

3. තවද යම් කරුණක් අනාවරණය කර ගැනීම සඳහා පොලිස් නිලධාරීන් විසින් විමර්ශන කටයුතු සිදුකිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මෙන්ම නීත්‍යානුකූල සහ සූක්ෂම විමර්ශන විධික්‍රම හඳුන්වා දෙමින් ඊට අදාළ පුහුණු වැඩමුළු පවත්වා නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු බවටද පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

4. එසේම සැකකරුවන් රඳවා ගනු ලබන සිරමැදිරි අධීක්ෂණය සඳහා යෝජිත ශ්‍රී ලංකා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි දක්වා ඇති CCTV කැමරා සවිකිරීම පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය හරහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවටද පොලිස්පති වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019. 11 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :-

1. අතිගරු ජනාධිපති, ආරක්ෂක අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහතා,
   ආරක්ෂක අමාත්‍යාංශය,
   කොළඹ.

2. පොලිස්පති,
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.

3. නීතිපතිතුමා,
   නීතිපති දෙපාර්තමේන්තුව,
   කොළඹ 12.

4. අධ්‍යක්ෂ
   ජාතික පොලිස් කොමිෂන් සභාව,
   බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
   කොළඹ 08

සැ:යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/ R-4